# සීතල යුද්ධය

බටහිර සමග කලක සිට ඇති වී තිබෙන නොහොඳ නෝක්කාඩු දැන් සීතල යුද්ධයක් බවට පත් වී ඇත. කොටි සංවිධානය සමග ආයුධ සන්නද්ධව කෙරුණු සටන් වෙනුවට දැන් ඇත්තේ බටහිර සමග කෙරෙන සීතල යුද්ධයකි. අද බටහිරට සිංහලත්වයට එරෙහිව යොදාගැනීමට මෙරට කොටි සංවිධානයක් නැත. එහෙත් එයින් කියන්නේ දැන් ලංකාවේ කොටි නොමැති බව නො වේ. වවුනියාවේ කඳවුරුවල තවමත් කොටි සාමාජිකයන් ඇති බව ආණ්ඩුවේ මතය වෙයි. මෙයින් එකකු හෝ දඬුවම් නො ලබා පිටවී යෑම උතුරේ දෙමළ ජනතාවටත්, රටටත්, ප්‍රශ්නයක් වනු ඇත. බිම් බෝම්බ සියල්ල ඉවත් කළත් නිසි පරීක්ෂණයකින් තොරව කොටින් නිදහස්කිරීම රටේ ස්වෛරීභාවයට නැවතත් ප්‍රශ්න මතුකරනු ඇත.

එහෙත් අද සොල්හයිම්ගේ සිට හිටපු ඇමරිකානු තානාපති බ්ලේක් දක්වාත් රනිල් වික්‍රමසිංහගේ සිට පාකියසෝතිලා ජෙහාන් පෙරේරලා පමණක් නොව සාමය සඳහා යැයි අටවාගෙන තිබෙන විවිධ ක්‍රිස්තියානි සම්මේලනවල සංවිධාන දක්වාත් අගරදගුරුතුමන්ලා දක්වාත් චැනල් ෆෝ හෙවත් බ්‍රිතානියේ හතරවැනි නාලිකාව යැයි ප්‍රසිද්ධ ජඩමාධ්‍යයයේ සිට මෙරටින් පැනගිය ජඩමාධ්‍යවේදීන් දක්වාත් සියල්ලන්ට අවශ්‍ය වී ඇත්තේ ඊනියා අවතැන් වූවන් මානුෂිකත්වයේ නාමයෙන් මුදාහැරීම ය. මේ අය සියළු දෙනාම එක් රෑනක කුරුල්ලෝ වෙති. මොවුන්ගෙන් බොහෝ දෙනකුට කොටි සමග විවිධ සම්බන්ධකම් තිබුණි. ඇතැම්හු කොටි සමග යුරෝපයේ පෙළපාළි ගියහ. තවත් අය කොටි වෙනුවෙන් විවිධ කටයුතුවල නිරත වූහ. කොටි වෙනුවෙන් යාඥා කළ ඔවුන් සමග රෝමයේ හා වෙනත් තැන්වල දේවපූජා පැවැත්වූවෝ ද ඒ අතර වෙති. ආණ්ඩුව ඔවුන් කවුරුන් වුවත් කිනම් උසස් තනතුරක් දැරුවත් කුමන සළු පිළි පෙරවාගෙන සිටියත් කුමන ලොගු පැළඳ සිටියත් කාගෙ කවුරු වුනත් ඉතා ඉහළ පෙළේ ගැහැණුන් හා පිරිමින් ආශ්‍රය කළත් ඔවුන්ගේ පැරණි හා නව ක්‍රියාකාරකම් ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතු ය. පාකියසෝති සරවනමුත්තුට මරණීය තර්ජන තිබෙන බවත් එයට තමන් විරුද්ධ බවත් රනිල්ගේ ඇබෙනියවූ මෛත්‍රී, සුනන්ද දේශප්‍රිය, උයන්ගොඩ ආදී පිරිසක් මුදල්ගෙවා පළකර ඇති පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රචාරය කර ඇත. මේ නිකම් ආවට ගියාට පළකරන පුවත්පත් දැන්වීම් නො වේ. පාකියසෝතිට ඇති මරණ තර්ජන කවරේදැයි අපි නො දනිමු. ඔහු මරන්නට අවශ්‍ය කාට ද යන්නත් ප්‍රශ්නයකි.  ඇතැම් විට සුනේත්‍රා බණ්ඩාරනායක  ඒ තොරතුරු දන්නවා ඇත. එහෙත් ඔහුට ඔහු විසින් පමණක් යමක් කිරීමට තරම් ශක්තියක් ඇති පුද්ගලයකු නොවන බව නම් අපි දනිමු.

කොටින්ට මානව අයිතිවාසිකම් ඇත. එහෙත් ඒ යුරෝපයේ මිස ලංකාවේ නො වේ. අප බොහෝ විට කියා ඇත්තේ ඊනියා මානව අයිතිවාසිකම් යනු අන්කිසිවක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඇති වූ සංකල්පයක් පමණක් බවත් ඉන් කෙරෙන්නේ එක් පැත්තකින් යුරෝපීය වැඩවසම් සමාජයේ සමස්ත සමාජයට හා ඒ ඇසුරෙන් රාජ්‍යයට බැඳ තිබූ පුද්ගලයාට රාජ්‍යයෙන් යම් නිදහසක් ලබාදීම බවත් අනෙක් පැත්තෙන් ක්‍රිස්තියානි නොව සංස්කෘතීන්ට එරෙහිව ඇතැම් බාධක පැමිණවීමට හා බලපෑම් ඇතිකිරීමට බටහිරයන්ට ඉඩ ලබාදීම බවත් ය. කොළඹ විශ්වවිද්‍යාලයේ බටහිර දේශපාලන විද්‍යාව උගන්වන උයන්ගොඩ ඒ බව බටහිරයන්ගේ හෝ වෙනත් අයගෙ හෝ ලිපි ලේඛනවල ඒ බව දැක ඇත්දැයි මම නො දනිමි. එහෙත් බටහිර මානව අයිතිවාසිකම් පිළිබඳ එවැනි ප්‍රකාශයක් අනගාරික ධර්මපාලතුමා නොකළ බව නම් මට විශ්වාසය. මා ඊ බව කියන්නේ ධර්මපාලතුමා නොකී දෙයක් අප විසින් කියා නොමැති බවට උයන්ගොඩ මහත් උජාරුවෙන් ප්‍රකාශයක් කර ඇති බැවිනි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් මා අස්කළ විට ඒ පිළිබඳ ව කරුණු කීමට මා සාමාජිකත්වය දැරූ වෘත්තීය සමිතිය ඉදිරියට යෑමට මට අවසර නුදුන් දේශපාලන විද්‍යාවේ සිට ගණිතය දක්වා විෂය ඉගැන්වූ හුරුවරු මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් උසස් අධ්‍යාපනය පිළිබඳ ඊනියා උපදේශකවරුන් ලෙස අද සමාජයේ වැජඹෙති. බටහිරයන්ගේ මානව අයිතිවාසිකම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධවන්නන්ට නොමැති බවට ඒ සුළු උදාහරණයක් පමණකි.

බටහිර රටවල් මුස්ලිම් කාන්තාවන්ට පර්දාව ඇඳීම තහනම්කරන්නේ බටහිර මානව අයිතිවාසිකම්වලට අනුව ය. අර මානව අයිතිවාසිකම් ගැන කතාකරන මෛත්‍රී, සුනිලා, කැට්ස් අයි නමින් ලියන්නියන් ඇතුළු නෝනලාට එංගලන්තයට හෝ ප්‍රංශයට හෝ ගිය විටක මේ පිළිබඳ විරෝධයක් දැක්වුවහොත් නරක ද? සදාම් හුසේන්ට බටහිරයන්ගෙන් ලැබුණු මානව අයිතිවාසිකම් කවරේ ද? ව්‍යාජ නඩු විභාග පැවැත්වීමක් යනු මානව අයිතිවාසිකම් ලබාදීමක් ලෙස හැඳින්විය හැක්කේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පමණ ය. නඩුත් හාමුදුරුවන්ගෙ බඩුත් හාමුදුරුවන්ගෙ යන පිරුළ තැනූ

© Prof. Nalin De Silva

විදග්ධ ගැමියා කසිකබල් ඇතැම් විශ්වවිද්‍යාලයීය මහාචාර්යවරුන්ට වඩා නිර්මාණශීලීත්වයක් ඇත්තෙකි. අප බටහිරයන්ගේ මානව අයිතිවාසිකම් ගැන තැකිය යුතු නො වේ. අපට පුද්ගලයා රාජ්‍යයට වඩා උසස් වන්නේවත් රාජ්‍යය පුද්ගලයාට වඩා උසස්වන්නේවත් නැත. බටහිර යුරෝපයේ ඔවුන්ගේ වැඩවසම් යුගයේ දී කතෝලික චින්තනය යටතේ රාජ්‍යය (පාප් වහන්සේ, අගරදගුරුවරු බිෂොප්ලා රජු රදළයන් ආදීන්) පුද්ගලයාට ඉහළින් හිඳ පුද්ගලයා බැඳ දමා තිබුණි. පසුගිය අවුරුදු පන්සියයක කාලයක බටහිර රටවල ක්‍රිස්තියානි නූතනත්වයෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි පුද්ගලයාට (එනම් නීතිඥයන් මිළයට ගත හැකි වත්කමක් ඇති ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පුද්ගලයාට) රාජ්‍යයෙන් යම් නිදහසක් ලබා දී ඇත.

අපට රාජ්‍යය හා පුද්ගලයා.අතර ඇත්තේ ගතික සමතුලිතතාවකි. බටහිරයන්ගේ වචනවලින් කියන්නේ නම් රාජ්‍යය ද පුද්ගලයා ද යනුවෙන් ද්විමය විරුද්ධතාවක් (බයිනරි ඔපසිෂන්) අපට නැත. ඒ අප ඇරිස්ටෝටලීය න්‍යායෙහි නොමැති බැවිනි. අපට රාජ්‍යය ද ප්‍රධාන නැත පුද්ගලයා ද ප්‍රධාන නැත යනුවෙන් කෝටියක් (කොණක්) චතුස්කෝටික න්‍යායෙහි ඇත. (ඒ බව ද ධර්මපාලතුමා නොදැන සිටි බව ජීවිතයේ කිසි දිනෙක සංකල්පයක් හෝ ප්‍රවාදයක් හෝ ගොඩනගා නොමැති උයන්ගොඩට මතක් කළ යුතු ය.) එහෙත් අපට ඉතිහාසයෙන් වියෝවීමට නො හැකි ය. අපට අවුරුදු දෙදහසකට වැඩි ලිඛිත ඉතිහාසයක් ඇත. පස්වැනි සියවසේ පමණ සිට මෙරට ඉතිහාසය හා අනාගතය සකස්විය යුතු අන්දම මහාවිහාරික භික්ෂූන් වහන්සේ අපට උගන්වා ඇත. අපි ථෙරවාද බුද්ධදහමේ ආරක්ෂකයෝ වෙමු. අපට ඒ ඉතිහාසයෙන් පැන යෑමට නො හැකි ය.

බටහිර පඬියෝ හා මෙරට ඔවුන්ගේ ගැත්තෝ (ඉහත නම් සඳහන් කෙරුණු එක රෑනේ කුරුල්ලන් ද ඇතුළුව) ඒ මිථ්‍යාවක් යැයි කියති. එහෙත් ඒ මිථ්‍යාවක් නොව පස්වැනි සියවසේ පමණ භාරතයෙන් ථෙරවාදය නැතිවනු දුටු මහාවිහාරික හා ආන්ද්‍ර ප්‍රදේශවාසී (තෙළිඟු කතා කළ අටුවා ලියූ) භික්ෂූන් වහන්සේ එකතු වී ගත් තීරණයක ප්‍රතිඵලයකි. මෙරට තිබූ අටුවා ද පාළියට පෙරළුණේ එහි ප්‍රතිඵලයක් ලෙස ය. බුද්ධඝෝෂ හිමි ආන්ද්‍රයෙන් වැඩම කළ භික්ෂූන් වහන්සේ නමකි. (වැඩි විස්තර සඳහා විදුසර පුවත්පතේ අපේ ප්‍රවාද කියවන්න). ඉහත සඳහන් පඬියන් ද වෙනත් පඬියන්ද බුදු දහම ඉගෙන බුදුන් වහන්සේට වැරදුන තැන් සෙවීමට උත්සාහ ගන්නා විවිධ පූජකවරුන් ද ගිනි පාගන්නන් ඇතුළු විවිධ මහාචාර්යවරුන් ද, අද උත්සාහ කරන්නේ බටහිරයන්ගේ අවශ්‍යතාව අනුව ථෙරවාදී සංස්කෘතිය නැතිකිරීමට ය. (සංස්කෘතිය ගැන සඳහන් වූ පමණින් දන්න - දන්න නොව- මහාචාර්යවරුන් සෑම දෙයක් ම සංස්කෘතියට ඌනනය කරන්නේ යැයි කලබල විය නැත.) අරාබියේ දී බටහිරයන් යුද්ධ කරන්නේ හුදෙක් තෙල් ටික ගිල ගැනීමට පමණක් නො වෙයි. අප කලින් කියා ඇති පරිදි ඒ යුද්ධය ලෝකය මවා ඇත්තේ කිනම් දෙවියන් වහන්සේ දැයි තීරණය කිරීම සඳහාත් ය.

බටහිරයන් අරඹා ඇති සීතල යුද්ධයට අප මුහුණ දෙන්නේ කෙසේ ද? ඇතැමකුට අනුව අප කුඩා රටක් බැවින් බටහිරයන් සමග තරගයට නොයා යුතු ය. මෙහි එතරම් ගත යුත්තක් නැත. ඇත්තේ එසේ කියන්නන්ගේ නිවටකම පමණ ය. අප බටහිරයන් කියූ දෙයට සවන් දුන්නේ නම්, එනම් ඔවුන්ගේ තර්ජනවලට බියෙන් අකුළා ගත්තේ නම් අපට කොටින් පරාජය කිරීමට නොහැකි වනු ඇත. බටහිරයන් අපට නොයෙකුත් බාධක ඇතිකරනු ඇත. ඇමතිවරුන්ට නිලධාරීන්ට විසා නොදීම වීසා දීමෙහි දී කරදර කිරීම, එතෙර ගුවන් තොටුපළවල දී අනවශ්‍ය පරීක්ෂණ කිරීම ඉන් එක් ක්‍රියා මාර්ගයක් පමණකි. ආර්ථික තහංචි ඇතිකිරීම, ඊනියා ආධාර කපා දැමීම තවත් ක්‍රියා මාර්ගයකි.

එහෙත් අප මේවාට බියවිය යුත්තේ අප ඔවුන්ගේ සංවර්ධන ආකෘතිය අනුගමනය කරන්නේ නම් පමණකි. අප අපේ ම වූ සංවර්ධනයක් ළඟා කරගැනීමට උත්සාහ ගන්නේ නම් මේ සියල්ල අපට ප්‍රශ්න නො වේ. අප කළ යුත්තේ අපට අවශ්‍ය සංවර්ධනය කුමක් ද යන්න පිළිබඳ ව යම් සම්මුතියක් ඇතිකර ගැනීම ය. ඒ සංවර්ධනය ඊනියා මිශ්‍ර ආර්ථිකයක් පදනම් කරගන්නක් නොවන බවත් පළමුව අපේ අවශ්‍යතා පිළිබඳ හැඟීමක් අපට තිබිය යුතු බව පමණක් මෙහි දී සඳහන් කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva